# දරුවන් උදෙසා බයිබලයක්

# සැම්සොන් - දෙවියන් වහන්සේගේ ශක්තිවන්ත මනුෂ්‍යයා



**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා:** Lyn Doerksen

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
**අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.**



බොහෝ කලකට පෙර ඊශ්‍රායෙල් දේශයේ මානෝවා නම් මිනිසෙක් ජීවත් වූයේය. ඔහුට සහ ඔහුගේ බිරිඳට දරුවන් සිටියේ නැත. දිනක් දෙවියන් වහන්සේගේ  දූතයා මානෝවා ගේ බිරිඳට දර්ශනය විය. “ඔබට ඉතා විශේෂ දරුවෙකු ලැබෙනු ඇතැ” යි  දූතයා පැවසුවේය.



ඇය තම සැමියාට අපූරු පුවත පැවසුවාය. මානෝවා, “අහෝ ස්වාමින් වහන්ස නැවතත් අප වෙත පැමිණිය මැනව. දරුවා වෙනුවෙන් අප කලයුතු දේවල් කියා දුන මැනවැ” යි කියා යාච්ඤා කළේය.



3



දේවදූතයා මානෝවාට පැවසුවේ දරුවාගේ කොණ්ඩය කැපීම නොකළ යුතු බවත්, කිසිදාක මත්පැන් පානය නොකළ යුතු බවත්, සමහර ආහාර වර්ග කිසි දිනක නොකෑ යුතු බවත්ය. දෙවියන් වහන්සේ විසින් මෙම දරුවා විනිශ්චයකරුවෙකු ලෙස තෝරාගෙන තිබුණි. ඔහු ඊශ්‍රායෙලයට නායකත්වය දෙනු ඇත.



4



දෙවියන් වහන්සේගේ සෙනඟට අනිවාර්යයෙන්ම උපකාර අවශ්‍යව තිබුණි. ඔවුන් තම ජීවිතයෙන් දෙවියන් වහන්සේව අත්හැර දැමූ අතර, පසුව ඔවුන්ගේ සතුරන් වන පිලිස්තිවරුන් අතින් ඔවුන්ට හිරිහැර පැමිණියේය. නමුත් ඔවුන් යාච්ඤා කළ විට දෙවියන් වහන්සේ ඇහුම්කන් දුන්සේක. දෙවියන් වහන්සේ ලෝකයේ ශක්තිමත්ම මිනිසා බවට පත්වන මේ ළදරුවා ඔවුන් වෙත එවූ සේක.

5



ඉතින් ඒ ස්ත්‍රිය පුත්‍රයෙකු බිහිකොට ඔහුට සැම්සොන් යන නම තැබුවාය. ඒ දරුවා වැඩුනේය. දෙවියන් වහන්සේ ඔහුට ආශීර්වාද කළ සේක. ස්වාමින් වහන්සේගේ ආත්මය ඔහු කෙරෙහි පහළ විය. සැම්සන් ඉතා ශක්තිමත් වූයේය. දිනක් ඔහු තම දෑතින් තරුණ සිංහයෙකු සමඟ සටන් කර උග මරා දැමුවේය!

6



පසු දිනක සැම්සොන්, සිංහයාගේ මළ සිරුරේ මී මැස්සන් රංචුවක් තැනූ මී වදයක මී පැණි රස බැලුවේය. ඔහු තේරවිල්ලක් සෑදුවේය. “ආහාර අනුභව කරන්නාගෙන් කෑමට යමක් පැමිණියේය, ශක්තිමත් කෙනාගෙන් මිහිරි දෙයක් පැමිණියේය”.

7



කිසිවකුට එහි තේරුම අනුමාන කළ නොහැකි විය. නමුත් සැම්සොන්ගේ පිලිස්ති ජාතික නව බිරිඳ, ඇයගේ මිතුරන්ට එහි තේරුම පැවසුවාය. මෙය සැම්සොන්ට දැඩි කෝපයක් ඇති කළේය.

8

පිලිස්තිවරුන් තම බිරිඳ, තම හොඳම මිතුරාගේ බිරිඳ කරදුන් විට සැම්සොන් තවත් කෝප වූයේය. ඔහු පළිගැනීමට සැලසුම් කළේය. නමුත් එය කරන්නේ කෙසේද? මුලින්ම සැම්සොන් හිවලුන් 300ක් අල්ලා ගත්තේය. ඉන්පසු ඔහු උන්ගේ වලිග දෙකෙන් දෙකට බැඳ, ඒවා අතර ගිනි පන්දම් රඳවා තැබුවේය.



9

ඉන්පසු සැම්සොන් පිලිස්තිවරුන්ගේ ධාන්‍ය කෙත්වලට හිවලුන් නිදහස් කර යැවීය!



10

දැන් පිලිස්තිවරුන්ට පළිගැනීමට අවශ්‍ය විය. සැම්සොන්, ඔහුව අල්ලා ගැනීමටත්, ඔහුව බැඳ, පිලිස්තිවරුන් විසින් මරා දැමීම සඳහා භාර දෙන්නටත් ඉඩ හැරියේය.



11

එහෙත් සමිඳාණන් වහන්සේගේ ආත්මය සැම්සොන් කෙරෙහි පහළ විය. ඔහු ලණු කඩා, මියගිය කොටළුවකුගේ අලුත් හකු ඇටයක් අහුළාගෙන සතුරන් 1000 ක් මරා දැමුවේය.



12

පිලිස්තිවරුන්ගේ කණ්ඩායම් සැම්සොන්ව සෙව්වෝය. එක් රාත්‍රියක ඔවුහු ඔහුව නගරයකට කොටු කර නගරයේ දොරටු වසා දැමුවෝය. නමුත් සැම්සොන් ඔහුගේ උරහිස් මත නගර දොරටුද තබාගෙන පිටතට ගියේය.



13

නමුත් සැම්සොන් දෙවියන් වහන්සේට අකීකරු වූයේය. ඔහු කීකරු වන තාක් කල් දෙවියන් වහන්සේ ඔහුට ශක්තිය ලබා දුන්සේක. දිනක් සැම්සොන් තම ශක්තියේ රහස පිලිස්ති ජාතික ඔත්තුකාරියක වූ දෙලීලාට කීවේය. සැම්සොන් නිදා සිටියදී ඔහුගේ හිසකෙස් කපා දැමීමට ඇය මිනිසෙකු යෙදෙව්වේය.



14



ඉන්පසු පිලිස්ති සොල්දාදුවන් දෙලීලාගේ නිදන කාමරයේදී සැම්සොන්ට පහර දුන්නෝය. සැම්සොන් දැඩි ලෙස සටන් කලත් ඔහුගේ ශක්තිය නැතිවී තිබුණි. ඔහුගේ සතුරෝ ඔහුගේ දෑස් අන්ධ කළෝය. අන්ධ හා දුර්වල වූ සැම්සොන් පිලිස්තිවරුන්ගේ වහලෙකු වූයේය. ඔව්හු දෙවියන් වහන්සේගේ සේවකයාට සිනාසුනෝය; සමච්චල් කළෝය.

15

පිලිස්තිවරුන්ගේ උත්සවයක් තිබුණේය. සැම්සොන්ව ලබාදීම ගැන ඔවුන් ඔවුන්ගේ මත්සය දෙවියා වන දාගොන්ට ප්‍රශංසා කළෝය. ඔව්හු බොමින් දාගොන්ගේ දේව මාළිගාවේ දී ප්‍රීති වූවෝය. ඔවුහු ඔවුන් වෙනුවෙන් රඟ දැක්වීමට සැම්සොන් කැඳවූහ.



16

පිරිමි ළමයෙක් සැම්සොන් ගෙනැවිත්, ඔහුට දේවමාළිගාව උසුලන ලද කණුවලට හේත්තු වීමට ඉඩ සැළසුවේය. පිලිස්තිවරුන් 3000 ක් වහලය මත සිටි අතර තවත් බොහෝ දෙනෙක් දේවමාළිගාවේ සිටියෝය. ඒ සියල්ලෝම ඔහුට සමච්චල් කළෝය.



17

නමුත් සිරගෙදරදී සැම්සොන්ගේ හිසකෙස් වැවෙන්නට පටන් ගෙන තිබුණි. ඔහු, “දෙවියන් වහන්ස, මාගේ ඇස් දෙක ගැන පළිගන්නා පිණිස මෙවර පමණක් මා ශක්තිමත් කළ මැනව” කියා යාච්ඤා කළේය.



18

දෙවියන් වහන්සේ සැම්සොන්ට නැවත ශක්තිය ලබා දේවිද? සැම්සොන්ට කළ නොහැකි දේ කළහැකි වේවිද? එසේය! සැම්සොන් ශක්තිමත් කුළුණු කඩා දැමුවේය. දාගොන්ගේ දේවමාළිගාව නටඹුන් බවට පත් වූයේ පිලිස්තිවරුන් දහස් ගණනක් මරා දමමිනි. සැම්සොන්ද මිය ගියේය.



19

සැම්සොන් - දෙවියන් වහන්සේගේ ශක්තිවන්ත මනුෂ්‍යයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

විනිශ්චයකාරයන්ගේ පොත 13-16

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

20

# අවසානය



14

60



මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)